සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 06 - 2023**

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

(01) සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර හා ව්‍යඤ්ජන අක්ෂර ගණන,
(i) 32 කි. (ii) 54 කි. (iii) 60 කි. (iv) 42 කි.

(02) මධ්‍යම පුරුෂ බහුවචන අනතීත කාල ක්‍රියා පදයකි.
(i) කළෙහි (ii) කරමු (iii) කළෙහු (iv) කරහු

(03) මහාප්‍රාණ අක්ෂර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(i) බ, ළ, හ, ජ (ii) ඡ, ඩ, ඣ, ඵ (iii) ධ, ෂ, ණ, ඨ (iv) ඨ, ඤ, ඹ, ශ

(04) 'ගෙවිලියක් දැරියන් සමඟ ගොවියන්ට ඇඹුල බෙදුවා ය' යන වාක්‍යයේ උක්ත පදය වන්නේ,
(i) ඇඹුල ය. (ii) දැරියන් ය. (iii) ගොවියන්ට ය. (iv) ගෙවිලියක් ය.

(05). ''ඌ'' ස්වරය සංකේතවත් කරන පිල්ලම
(i) කොම්බුව ය. (ii) දිගු පාපිල්ල ය. (iii) දිගු ඇදපිල්ල ය. (iv) ගැටපිල්ල ය.

- අංක 6 හා 7 ප්‍රශ්නවල දී ඇති පදවලට සමානාර්ථ පදය තිත් ඉරි මත ලියන්න.

(06) පණිදා - ............................................................

(07) ඇතා - ............................................................

- අංක 8 හා 9 ප්‍රශ්නවල දී ඇති පදවලට විරුද්ධාර්ථත් පදයක් බැගින් තිත් ඉරි මත ලියන්න.

(08) විවෘත - ............................................................

(09) අපනයනය - ............................................................

- අංක 10 හා 11 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු පිළිතුර තෝරන්න.

(10) (i) සංඛ්‍යාව, අවබෝධය, ගණකය
(ii) චායාරූප, ප්‍රතිපලය, ගංඟාව
(iii) ස්තානය, කෘථ්‍ය, සංඟයා
(iv) භයානක, දක්ෂිණ, පුෂ්පය

(11) (i) පරීක්ෂණය, මහලු මිනිසා, මැණියෝ
(ii) අභ්‍යාසය, ලමයා, වර්සය
(iii) දර්ෂණය, ප්‍රස්න, විද්‍යාපීටය
(iv) ස්තාවර, අංබය, බස්නැවතුම්පොල

(12) ''පුල්ලි ගොනා තණකොළ කයි'' මෙම වාක්‍යයෙහි සඳහන් නාම විශේෂණ පදය තිත් ඉරි මත ලියන්න.

..........................................................................

(13) ''ළමයි ප්‍රීතියෙන් සිනාසෙති'' මෙම වාක්‍යයේ සඳහන් ක්‍රියා විශේෂණ පදය තිත් ඉරි මත ලියන්න.

..........................................................................

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වාක්‍යය සම්පූර්ණ කිරීමට සුදුසු උක්ත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(14) .............................. කෑම සොයා පියෑඹුවා ය. (කිරිල්ලියක/ කිරිල්ලියෝ/ කිරිල්ලිය)

(15) .............................. ක්‍රීඩා පිටිය පිරිසිදු කළ හ. (කම්කරුවා/ කම්කරුවෝ/ කම්කරුවන්)

(16) .............................. ඇත දියඹට ඔරුව පැදෙව්වේ ය. (ධීවරයෝ/ ධීවරයෙකු/ ධීවරයෙක්)

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු උක්ත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(17) ගොවියා කෙත්යායට ජලය .................................. (සපයති/ සපයයි/ සපයන්නෝ ය).

(18) දද පෙළ සුළඟට .................................. (සෙලවූහ/ සෙලවෙති/ සෙලවෙයි).

(19) වෙළෙන්දෝ භාණ්ඩ ප්‍රවාහනය .................................. (කරති/ කරයි/ කළේය).

(20) පහත සඳහන් වාක්‍යය නිවැරදි ව පද බෙදා සුදුසු විරාම ලකුණු යොදා නැවත තිත් ඉරි මත ලියන්න.

අනේදෙයියනේතාත්තාගේඅවවාදෙපිළිපැද්දානම්කොච්චරහොඳදඅපොයිමංකරගත්තුමෝඩකමක්

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

- ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්න සඳහා අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු අතර 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.

---

(01) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ජනශ්‍රැතියට අයත් අංග දෙකක් ලියන්න.

(ii) පහත නාම පදවල බහුවචන නාම පදය ලියන්න.

මිනිසා - ..................................................

සතා - ..................................................

පුටුව - ..................................................

ඔහු - ..................................................

(iii) ''හත්පණ'' කෘතිය ලියූ කතුවරයාගේ ළමා ප්‍රබන්ධ දෙකක නම් ලියන්න.

(iv) පහත නාමපදවල අනුක්ත පදය ලියන්න.

නුවරවැසියෝ - ..................................................

මුරකරුවා - ..................................................

(v) ''ගල්මැදේවළ දිය කඩිති දෙකකින් යුක්ත විය'' මෙම කොටස උපුටාගන්නා ලද පාඩමේ නම ලියන්න.

(ලකුණු $2 \times 5 = 10$)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) වන සම්පත සුරකිමු.

(ii) මාර්ග අනතුරු වළකමු.

(iii) අලුත් අවුරුදු උත්සවය.

(iv) ගංගාවක් කතා කරයි.

(v) ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ වැදගත්කම.

(ලකුණු 20)

(03) ඔබේ පාසලේ පවත්වන විද්‍යා ප්‍රදර්ශනය නැරඹීමට ආරාධනා කිරීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

නැතහොත්

ඔබ පැසලේ පවත්වන විද්‍යා ප්‍රදර්ශනය පිළිබඳ තොරතුරු විස්තර කරමින්, හැකිනම් විද්‍යා ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන මෙන් ඉල්ලමින් දුර බැහැර සිටින ඔබේ පියාට යවන ලිපිය ලියන්න.

(ලකුණු 10)

(04) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

මිනිසාගේ විශිෂ්ටතම නිර්මාණය භාෂාව යි. අදහස් හා හැඟීම් සන්නිවේදනය සඳහා බිහි වූ භාෂාව පශ්චාත් කාලීන ව භාෂණය හා ලේඛනය වශයෙන් විභේදනය විය. භාෂණයේ දී ශ්‍රැතිගෝචර ශබ්ද ලේඛනයේ දී දෘෂ්ටිගෝචර සංකේත බවට පත් වෙයි. සිංහල ජන කොට්ඨාසය නගන ශබ්ද සිංහල වර්ණ මාලාවෙන් සංකේතවත් වේ. එහෙත් සිංහලයා වහරන සියලු ම ශබ්ද වර්ණමාලාවෙන් සංකේතවත් වෙති' යි එයින් අදහස් නො කෙරේ. භාෂාවේ අරපිරිමැස්ම සඳහා ඇතැම් ශබ්දවලට සංකේත භාවිත නොවේ. සිංහල ලේඛනයේ දී භාවිත කෙරෙන සංකේත සමුදාය සිංහල අක්ෂර මාලාව ලෙසින් හැඳින්වේ. දැනට විද්‍යමාන ලේඛනගත සාක්ෂ්‍ය අනුව සිංහල වර්ණ මාලාවේ ප්‍රභවය ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවස දක්වා දිව යයි.

(i) මිනිසාගේ විශිෂ්ටතම නිර්මාණය කුමක් ද?

(ii) භාෂාව පසු කාලීනව විභේදනය වූයේ කෙසේ ද?

(4) WWW.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

(iii) සිංහල වර්ණ මාලාවෙන් සංකේතවත් වන්නේ කුමක් ද?

(iv) භාෂාවේ ඇතැම් ශබ්දවලට සංකේත භාවිත නොවන්නේ ඇයි?

(v) සිංහල වර්ණමාලාවේ ප්‍රභවය කුමන කාලයක් දක්වා ගමන් කරයි ද?

(ලකුණු $2 \times 5 = 10$)

- **5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

(05) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) 'ආ මෝඩ ඉබ්බෝ, දැන් පෙඟුණා ඇද්ද?'

(අ) මෙම ප්‍රකාශය යෙදුණු ජනකතාව ඇතුළත් පොතේ නම ලියන්න.

(ආ) එහි සම්පාදකවරයාගේ නම ලියන්න.

(ii) පහත ජාතක කතා පාදක කරගනිමින් ලියන ලද කාව්‍ය ග්‍රන්ථවල නම් ලියන්න.

(අ) ගුත්තිල ජාතකය - ................................................

(ආ) සත්තුභත්ත ජාතකය - ................................................

(iii) 'ඒ සතාගේ ගමන තමා ගමන' මෙම ප්‍රකාශය උපුටාගත්,

(අ) පාඩමේ නම ලියන්න.

(ආ) එම කතාව උපුටාගන්නා ලද පොතේ නම් ලියන්න.

(iv) රොබට් නොක්ස්ගේ වාර්තා ඇසුරින් ලියැවුණු

(අ) සිංහල කෘතිය කුමක්ද?

(ආ) එහි කතුවරයා ලියන්න.

(v) පහත කවිය සම්පූර්ණ කරන්න.

උදා දිනිඳු කර හරණේ

විදා අඳුරු දිසි කිරණේ

(අ) ........................................

(ආ) ........................................

(ලකුණු $2 \times 5 = 10$)

(06) පහත සඳහන් ප්‍රකාශ කවුරු විසින් කා හට ප්‍රකාශ කරන ලද්දේ දැයි ලියන්න.

(i) ''ඒකත් හරි තමා''

(ii) ''ළිප ළඟට ගොස් ළිපෙන් ගිනි පෙනෙල්ලක් අරගෙන යන්ට''

(iii) ''අම්මා එක්ක යන්නේ මම''

(iv) 'අනේ! ආයුබෝවන්ට මම ඒ දෙපොළ ම සොයන්නට ගියෙමි''

(v) ''ගොඩින් පැන ගත්ත හුගක් ළඟ හින්ද''

(ලකුණු $2 \times 5 = 10$)

(07) පහත අනතීතකාල වාක්‍යය අතීතකාලයට හරවා ලියන්න.

(i) වෛද්‍යවරිය රෝගියා සුවපත් කරයි.

(ii) ගුවන් නියමුවා ගුවන් යානය ගුවන් ගත කරයි.

(iii) තරගකරුවෝ ක්‍රීඩා පිටියට පැමිණෙති.

(iv) නිවස ගංවතුරට කඩා වැටෙයි.

(v) පියුම් විල අලංකාර කරයි.

(4) WWW.PastPapers.WiKi (4)

(ලකුණු $2 \times 5 = 10$)



PAST PAPERS WIKI

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 06 - 2023

# දෙවන බස සිංහල

## පිළිතුරු පත්‍රය

### I - කොටස

(01) 1. ඉ
2. ඕ
3. නෙ
4. මේ
5. නු
6. ආ
7. වෝ
8. ර
9. මි
10. යා

(1 × 10 = ලකුණු 10)

(02) 1. ල්, ට්
2. ටි, හෙ
3. පූ, ක
4. ඇ, හැ
5. බි, හි

(1 × 10 = ලකුණු 10)

(03) 1. වට්ටක්කා
2. පැපොල්
3. කළය
4. කුඩය
5. ලියුම

(1 × 10 = ලකුණු 10)

(04) 1. දුම්රිය
2. යාපනය
3. වම්බටු
4. තාප්පය
5. කෙසෙල් ගෙඩි

(1 × 10 = ලකුණු 10)

(05) 1. රෙදි කුඩෙද?
2. විදුලි කොටනවා
3. මුරුංගා කීය ද?
4. බත් කන්න
5. කපුටා ඉගිලුණා

(1 × 10 = ලකුණු 10)

(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

## II - කොටස

(01) (i) කෑමට පෙර අත් සෝදන්න.

(ii) කෑම කොළ කුඩේට දමන්න.

(iii) මම එක ගෙඩියක් කන්නම්.

(iv) දර ටික ගෙට ගන්නම්.

(v) අඹ ගෙඩියක් කීය ද?

(2 × 5 = ලකුණු 10)

(02) (i) එනවා

(ii) සුබ

(iii) කොග්ගල

(iv) මූඩිය

(v) පාර (2 × 5 = ලකුණු 10)

(03) (i) ඉඳි ආප්ප

(ii) පොත

(iii) ගේට්ටුව

(iv) ඇපල්

(v) හොට (2 × 5 = ලකුණු 10)

(04) නිවැරදි වාක්‍යවලට ලකුණු දෙන්න

(2 × 5 = ලකුණු 10)

(05) (i) පුටුව

(ii) මේසය

(iii) මීදි

(iv) පීරිසිය

(v) අම්මා

(vi) පුතා

(vii) ජෝගුව

(viii) කෝප්පය

(ix) භාජනය/ බේසම

(x) දොර රෙද්ද

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න